| | | |
|---|---|---|
| සුවෙන් පෙරට<br>eඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
| | | වාරය - II |
| ශ්‍රේණිය : 11 | විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 12 පාඩම - බස ඉපදුණු සැටි අසනු ය විස්තර |

## බුද්ධි මණ්ඩල සාකච්ඡාව:

බුද්ධි මණ්ඩල සාකච්ඡාව විද්වත් මණ්ඩල සාකච්ඡාව ලෙස ද හඳුන්වයි.

කිසියම් විෂය ක්ෂේත්‍රයක ප්‍රවීණත්වයක් ඇති විද්වතුන්ගේ සහභාගීත්වයෙන්, කිසියම් තේමාවක් පාදක කර ගෙන කරනු ලබන සාකච්ඡාව බුද්ධි මණ්ඩල සාකච්ඡාව ලෙස හඳුන්වයි.

## බුද්ධි මණ්ඩල සාකච්ඡාවක විශේෂතා:

- කිසියම් විෂය ක්ෂේත්‍රයක ප්‍රවීණත්වයක් ඇති විද්වතුන් සහභාගී විය යුතු ය.
- සාකච්ඡාවට තේමාවක් පාදක කරගත යුතු ය.
- සාකච්ඡාවට විචාරශීලීව සවන් දිය යුතු ය.
  (මනාව ග්‍රහණය කර ගනිමින්, අවබෝධ කර ගනිමින්, තහවුරු කර ගනිමින් ඇහුම්කන් දීම විචාරශීලීව සවන් දීම වේ.)
- විෂය ක්ෂේත්‍රය පිළිබඳ මනා දැනුමක් ඇති පුද්ගලයකු විසින් සාකච්ඡාව මෙහෙය විය යුතු ය.

### පාඩමට අදාළ සාකච්ඡාවේ ආරම්භය:

- වැඩසටහනේ නම : ‘හෙළ බස් මහිමය’
- දිනය : 2015.03.13
- ස්ථානය : ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
- විද්වත් මණ්ඩලය : මහාචාර්ය විමල් ජී. බලගල්ල සූරීන්
  මහාචාර්ය ජේ. බී. දිසානායක සූරීන්
- මෙහෙයවන්නා : තේමාව පිළිබඳ දැනුමක් ඇති නිවේදකයෙක්
- සහභාගීවන්නන් : ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවය ශ්‍රවණය කරන සුවහසක් ශ්‍රාවක ජනයා



මහාචාර්ය විමල් ජී. බලගල්ල සූරීන්



මහාචාර්ය ජේ. බී. දිසානායක සූරීන්

## බස ඉපදුණු සැටි අසනු ය විස්තර:

- භාෂාව මානව හා සාමාජීය නිෂ්පාදනයකි.
- ඒ පිළිබඳ මත දෙකක් මිනිසුන් අතර පවතී.
  - ආගමික විශ්වාස මත පදනම් වූවක් බව
    බෞද්ධ හින්දු ඉගැන්වීම් අනුව විවිධ අයුරින් මානව සමාජය නිර්මාණය වූ ආකාරය පිළිබඳව ආගමානුකූල මත පළවී ඇත.
  - පරිණාමවාදය මත පදනම් කරගත් විද්‍යාත්මක මතයක් බව
    පරිණාමවාදයට අනුකූලව සැබෑ මානව අවස්ථාවටපත් වීමත්, භාෂාවේ පහළ වීමත් එක ම අවධියක සිදු වූ බව ප්‍රකාශ වේ.

## භාෂාවේ ආරම්භය:

- මුලින් වානරයන්ගේ, මානවයන්ගේ පාෂාණභූත ඇට සැකිලි, ශීර්ෂ කපාලය ආදී ආශ්‍රය කර ගෙන කළ කාල සීමා නිර්ණයේ දී විශ්වාස තිබුණේ අවුරුදු තුන් ලක්ෂයකට ඉහත සැබෑ මානවයාගේ ආරම්භයත් සමඟ භාෂාවේ ආරම්භය සිදු වූ බවයි.
- 1959 ටැන්සානියාවේ ඔල්ඩුවායි යන ස්ථානයේ තිබී හමු වූ පාෂාණභූත ඇට සැකිල්ලක් මාර්ගයෙන් කරන ලද කාල නිර්ණයේ දී අවුරුදු දාහත් ලක්ෂ පනස් දාහකට පෙර භාෂාවේ ආරම්භය සිදු වී ඇතැයි ප්‍රකාශ වේ.

## භාෂාව නිපදවා ගැනීම හෙවත් භාෂාවේ උපත:

- මානවයා සතු එක් ශක්‍යතාවයකි භාෂා ශක්‍යතාව.
  (අදහස් ප්‍රකාශ කිරීම සඳහා ශබ්ද නිකුත් කිරීමේ හැකියාව ශක්‍යතාවය යි.)
- මිනිසා වානර මානව අවස්ථාවේ අවශ්‍යතා ප්‍රකාශ කිරීම සඳහා ශබ්ද යොදා ගෙන ඇත. මේ විවිධ ශබ්ද හා ශබ්ද සංයුති සඳහා සම්මුතියකට පැමිණීම භාෂාවේ උපත ලෙස හඳුන්වයි.

**ජීව භාෂා:**

- නිශ්චිත ලෙස භාෂා ගණනය කිරීම අසීරු ය.
- භාෂාවේ උපත සහ භාෂාවක උපත යනු කොටස් දෙකකි.
- භාෂා උපභාෂා වර්ග දෙකකි. උපභාෂාවල ප්‍රාදේශික උපභාෂා තිබේ. භාෂා ගණන් කිරීමේ දී මෙවැනි භාෂා ද අන්තර්ගතය.
- සිංහල, දෙමළ, හින්දි, ඉංග්‍රීසි, චීන, පෘතුගීසි, ස්පාඤ්ඤ, මාල්, දිවෙහි යනු භාෂා කිහිපයකි.

**භාෂා ඥාතීත්වය:**

- භාෂා ඥාතීත්වය සමඟ මූල භාෂා සංකල්පය ශිෂ්ට සමාජවල පහළ විය.
- මූල භාෂා පිළිබඳ බෞද්ධ මතය වූයේ මුල් ම භාෂාව පාලි හෙවත් මාගධී යන්නයි.
- ‘පටිසම්භිදා මග්ගඅටුවාව’ කෘතියෙහි ද මේ කියමන සනාථ කර ඇත.
- ලෝකයේ සමහර රටවල පිතු බස දක්නට පුළුවන. ජර්මනිය එයට උදාහරණයකි.
- විජය කුමරු වංග භාෂාවත් මදුරා දේශයෙන් ගෙනා බිසව දකුණු ඉන්දියානු භාෂාවත් කතා කර ඇත.
- භාෂා ඥාතීත්වය පිළිබඳ විමසීමේ දී වෙනස්කම් ඇති බව පෙනී යයි.
- මූල භාෂා සංකල්ප පිළිබඳ මතයට අනුව බයිබලයේ පරණ තෙස්තමේන්තුවේ හැටියට දෙවියෝ මුලින් ම කතා කළ භාෂාව හීබ්රු භාෂාවයි.
- ග්‍රීක ජාතික ඉතිහාසඥයකුවන හෙරඩෝටස්ට අනුව ක්‍රි.පූ. 6වන සියවසේ මිසරයේ සාමිතිකස් රජු මූල භාෂා පර්යේෂණයක් කර තිබෙනවා. එම පර්යේෂණයේ විශ්වාසය වන්නේ ෆ්‍රිජියන් භාෂාව ලෝකයේ මුල් ම භාෂාව බවයි.

**භාෂාව:**

- භාෂා උපර්ජනය සිදු වන්නේ කනට ඇසෙන දේ පදනම් කර ගෙනය.
  ( මිනිස් ළදරුවකු භාෂාවක් ඉගෙන ගන්නේ තමා අවට ව්‍යවහාර වන භාෂාව ශ්‍රවණය කිරීමෙනි යන්න භාෂා උපර්ජනයයි.)
- භාෂාව පරිසරයෙන් ලබා ගන්නා දෙයකි.
- භාෂාව සංස්කෘතික උරුමයකි.
- භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවයකි.

❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

1) විද්වත් සාකච්ඡාවේ කරුණු ගෙන හැර දක්වන්නේ කුමන වැඩසටහනක් ඇසුරෙන් ද?

2) භාෂාවේ ආරම්භය පිළිබඳ මිනිසුන් දැරූ මත දෙක කුමක් ද?

3) බෞද්ධ පිළිගැනීමට අනුව කල්ප විනාශයෙන් පසු ලොව පළමු ව පහළ වෙන්නේ කවුරුන් ද?

4) පරිණාමවාදයට අනුව ලොව පහළ වෙන්නේ කුමන ජීවීන් ද?
5) මිනිසා අතර තිබූ ශක්‍යතා දෙකක් නම් කරන්න.
6) මාලදිවයිනේ කතා කරන භාෂාව කුමක් ද?
7) "දැන් අපි ස්වාධීන යි,අපි කතා කරන්නේ අපේ බස" යන්න සඳහන් වන්නේ කුමන ප්‍රදේශයක භාෂාවක් පිළිබඳ හැඳින්වීමේදී ද?
8) බෞද්ධ මතයට අනුව මූල භාෂාව කුමක් ද?
9) බයිබලයේ පරණ තෙස්තමේන්තුවේ ආකාරයට මූල භාෂාව කුමක් ද?

10) භාෂා ශක්‍යතාව උපතින් ලැබුණත් භාවිත කරන භාෂාව ලැබෙන්නේ කුමන ආකාරයෙන් ද?

❖ **පහත සඳහන් වචනවල අරුත් පැහැදිලි කරන්න.**

1) කල්ප විනාශය -
2) ශීර්ෂ කපාලය -
3) ශක්‍යතාව -
4) ජීව භාෂා -
5) වෘත්තාන්තයක් -

ඩබ්.ජී.සී.කේ. හඟුරන්කෙත මිය
ගුරු උපදේශිකා (සිංහල)